SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
09	පෙරදිග සංගීතය	I,II	පැය 1 1/2

නම :- ..... විභාග අංකය :- .....

I කොටස

සැලකිය යුතුයි:

*** ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ **දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) නි් රි ස ..., නි් ස ගු ම ප... මෙම ස්වර බන්ධ අයත් රාග පිළිවෙලින්,

(1) හිම්පලාසි - යමන් (2) හිම්පලාසි - බිලාවල්

(3) යමන් - හිම්පලාසි (4) යමන් - භූපාලි

(02) නි් රි ස , නි් රි ග රි ස, ... හිස්තැනට ගැළපෙන ස්වර බන්ධය වන්නේ,

(1) නි් රි ග ම ග රි ස (2) නි් රි ග ම′ ග රි ස

(3) නි් රි ග ම′ ප ම′ ග රි ස (4) නි් රි නි් රි ග ම′ ග රි ස

(03) හිම්පලාසි රාගයේ ආරෝහණය තුළ ස්වර දෙකක් නොයෙදෙන අතර, එම ස්වර දෙක හා ඒවා හඳුන්වන ස්වර විශේෂය වන්නේ,

(1) ම - ස වාදී සංවාදී ස්වර (2) ග - නි - කෝමල ස්වර

(3) රි - ධ කෝමල ස්වර (4) රි - ධ වර්ජිත ස්වර

(04) බිලාවල් රාගයේ ආරෝහණ ස්වර මධ්‍යමය ශ්‍රැති ස්වරය ලෙස ගෙන වාදනය කිරීමේ දී ලැබෙන ස්වර පිළිවෙළ වන්නේ,

(1) ම ප ධ නි ස් රි් ග් ම් (2) ම ප ධ නි ස් රි් ග් ම්

(3) ම ප ධ නි ස් රි් ග් ම′ (4) ම ප ධ නි ස් රි් ගු ම

(05) විශේෂ උත්සව අවස්ථාවක දී මඟුල් බෙර වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩ යුගලය වන්නේ,

(1) දවුල - හොරණෑව (2) ගැටබෙරය - හොරණෑව

(3) ගැටබෙරය - හක්ගෙඩිය (4) පහතරට බෙරය - තම්මැට්ටම

(06) සබරගමු වන්නමක් වන තිසරා වන්නමේ නාදමාලාව ඇසුරින් තනු නිර්මාණය වී ඇති සරල ගීයකි.

(1) රන්වන් කරල් සැලෙයි. (2) දෑතට වළලු

(3) මල්සරා බැල්ම හෙලා (4) අක්ක නගාලගෙන බොලඳ සිනා

For Educational Purpose Only

(07) "භරතමුණි" ගේ නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන නාට්‍ය ප්‍රභේද අනුව ලෝකධර්මී නාට්‍ය ගණයට වැටෙන තාත්වික නාට්‍යයකි.

(1) මනමේ (2) බෙරගම (3) කැලණි පාලම (4) කරදිය

(08) ගිටාරයක පළමු තත (1^{st}) හා හයවෙනි තත (6^{th}) උච්ච, මන්ද්‍ර වශයෙන් එකම ස්වරයකට සුසර කරයි. එම ස්වරය වන්නේ,

(1) A (2) G (3) E (4) b

(09) එකෝඩියනය හා විදුලි ඕගනය යන සංගීත භාණ්ඩ දෙකේම දැකගත හැකි පොදු ලක්ෂණයකි.

(1) විදුලිය භාවිත කිරීම (2) සුළඟේ ආධාරයෙන් වැයීම

(3) ස්වර පුවරුවක් සහිත වීම (4) ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ වී තිබීම

(10) බටහිර සංගීතයට අනුව ඉහළ ම හඬතලය වන්නේ,

(1) Soprano (සොප්‍රානෝ) (2) Alto (ඇල්ටෝ)

(3) Tener (ටෙනර්) (4) Bass (බේස්)

(11) /දො ං / ජී ං ත / මෙම බෙර පදය සඳහා තිත් සංඥා යෙදෙන නිවැරදි පිළිවෙල වන්නේ,

(1) / / / / (2) / ∧ / ∧ / (3) / / /∧/ (4) / ∧ / / /

(12) බටහිර සංගීත ප්‍රස්තාරයක මාත්‍රා 2ක් නිහඬ බව දැක්වීමට යොදන සංකේතය වන්නේ,

(1) Crochet Rest (ක්‍රොචට් රෙස්ට්) (2) Minim Rest (මිනිම් රෙස්ට්)

(3) Semibrive Rest (ක්‍රොචට් රෙස්ට්) (4) Quaver Rest (ක්වෙවර් රෙස්ට්)

(13) ස - ස රි / ග - - - / ම - ග - / ස - - - / මෙම ස්වර පාදයට සුසංගත වන ස්වර පාදය වන්නේ,

(1) ග - ග ම / ප - - - / ධ - ප - / ග - - - / (2) ප - ප ධ / නි - - - / ප - ම - / ග - - -

(3) ග - ධ ප / රි - - - / ග - ම - / ධ - - -/ (4) නි - ධ ප / ම - - - / රි - ග - / ම - - - /

(14) ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් ගැයූ දේශභිමානී ගීයකි.

(1) පෙරදිග මුතු ඇටයයි මේ. (2) මගේ රටට දළඳා හිමි සරණයි.

(3) මේ සිංහල අපගෙ රටයි (4) සසර වසන තුරු

(15) ජනප්‍රිය (pop) සංගීත වාදනයේ දී ප්‍රධාන තැනක් ගන්නා තාල වාද්‍ය භාණ්ඩයකි.

(1) ඔක්ටපෑඩය (2) ගිටාරය (3) ඕගනය (4) සින්ත්‍යයිසරය

(16) ගැමි ගීයක සුවිශේෂී ලක්ෂණයක් නොවන්නේ,

(1) අව්‍යාජ බව (2) ගැමි අත්දැකීම් හා සිතුවිලි

(2) දේශීය සංස්කෘතියේ අනන්‍යතාවය (4) අතිශයෝක්ති වර්ණනා

For Educational Purpose Only

SLGURU.LK

(17) සංගීත ප්‍රසංගයක භාවිත කරන තාක්ෂණික මෙවලම් අතරින් තමා වෙත ලැබෙන සංගීත නාදය හෝ කටහඬ විවිධ ආකාරයෙන් වෙනස් කිරීමේ හැකියාව ඇති උපකරණයකි.

(1) ඇම්ප්ලිෆයර් (2) මික්සර් (3) ස්පීකර් (4) මයික්‍රෆෝනය

(18) සංගීතය සඳහා ජන සංගීතයේ ශාන්ති කර්ම නාද රටා පාදක කොටගත් නාට්‍යයකි.

(1) බෙරහඬ (2) කරදිය (3) කුවේනි (4) රතුහැට්ටකාරි

(19) 'පේමතෝ ජායතී සෝකෝ... නාට්‍යයේ එන ගීයකි.

(1) අන්න පලන් සඳ..... (2) කොයි හේනට එනවද බෙල?

(3) ඇදුරුතුමා වන්න මගේ (4) හනික වරෙව් කොල්ලනේ

(20) දේශීය සංගීත භාණ්ඩ පිළිබඳ නිවැරදි කරුණකි.

(1) දේශීය භාණ්ඩ අතර තත් භාණ්ඩ නැත.

(2) දේශීය භාණ්ඩ අතර සුෂිර භාන්ඩ නැත.

(3) දේශීය භාණ්ඩ යනු බෙර වර්ග පමණකි.

(4) දේශීය භාණ්ඩ අතර ඝන භාණ්ඩ නොමැත.

(ලකුණු 2 x 20 = 40)

II කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) (i) පහත දැක්වෙන රාග ලක්ෂණ අදාළ වන රාගයේ නම ඉදිරියෙන් ලියන්න.

	රාග ලක්ෂණය	රාග නාමය
1.	කල්‍යාණ ඨාඨයෙන් ඉපදේ	.....
2.	"ග" සහ "නි" වාදි සංවාදි වේ.	.....
3.	ඖඩව සම්පූර්ණ ජාති රාගයකි.	.....
4.	ස රි ම් ප ධ ස්වර අනුවාදි වේ.	.....
5.	ග , නි ස්වර කෝමල වේ.	.....

(ලකුණු 05)

(ii) පහත සඳහන් ස්වර අභ්‍යාසය අදාළ වන රාගය හඳුනාගනිමින් හිස්තැනට සුදුසු ස්වර යොදා සම්පූර්ණ කරන්න.

|නි රි x x | රි x x ප | ග x x x |ම් x x නි|

|ප ධ x x | ස් x ධ ප | නි ධ x x |x x x ග |

|ප x x රි | x ග x ස |

(ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(02) දී ඇති නාට්‍ය නාමාවලිය යොදාගනිමින් නවනාට්‍ය පිළිබඳ රුක් සටහන සම්පූර්ණ කරන්න.

(හුණුවටය, මනමේ, සිංහබාහු, තාරාවෝ ඉගිලෙති, අංගාරා ගඟ ගලාබසී,
නරිබෑණා, බෙරහඬ, මීපුරවැසියෝ, දෙපානෝ,
කුණ්ඩලකේශී, පේමතෝ ජායතී සෝකෝ)



(ලකුණු 10)

(03) (i) පහත දක්වා ඇති හින්දුස්ථානි තාල පදය නම් කර හිස්තැන් පුරවා තාලය සම්පූර්ණ කරන්න.

x		2			0		3		
-	නා	-	ධි	-	ති	-	-	-	නා
1	2	3	4	5	6	7	8	9	10

(ලකුණු 03)

(ii) ඉහත තාලයට සමාන දේශීය තිත නම් කර උඩරට බෙර පදය ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(iii) සිරි සාර අති ශාන්ත
රමණීය හෙළ දීප
මගෙ මෑණියනි ප්‍රේම
ඔබෙ පා වඳිමි....
ඉහත තාලානුරූපව මෙම ගීතය පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(04) රාගයක යෙදෙන විශේෂිත ස්වර පිළිබඳව පහත දක්වා ඇති ඡේදය සම්පූර්ණ කරන්න.

(වාදී, සංවාදී, අනුවාදී, විවාදී, වර්ජිත, ජීව, ම, ස, සරිම්පධ, ග, ධ)

රාගයක වැඩි වශයෙන් යෙදෙන ප්‍රධාන ස්වරය ..... ස්වරයයි. එය ..... ස්වරය යනුවෙන් ද හඳුන්වයි. එම ස්වරය හරුණු විට වැඩි වාර ගණනක් යෙදෙන ස්වරය..... ස්වරයයි. භූපාලි රාගයේ වාදී සංවාදී ස්වර වන්නේ ..... ස්වරයයි. ..... ස්වර යනු වාදී සංවාදී ස්වර හැර ඉතිරි ස්වරයි. යමන් රාගයේ ..... යනු අනුවාද ස්වරයි. රාගයක නොයෙදෙන ස්වර ..... ස්වර වේ. රාගයක නොයෙදෙන එහෙත් ආගන්තුක ස්වර වශයෙන් ඉඳහිට යෙදෙන ..... ස්වර මගින් රාගයක රසයක් අපදවා ගත හැකි ය. හිම්පලාසි රාගයේ ආරෝහණය ද රි, ධ ස්වර ..... වේ. කාෆි රාගයේ ශුද්ධ ගාන්ධාරය හා නිෂාදය ..... ස්වර ලෙස ඉඳහිට යෙදේ.

(ලකුණු 10)

SLGURU.LK
For Educational Purpose Only

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)

Visit SLGURU.LK to download papers and notes.